# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2010 මැයි මස 07 වන දින

II වන කොටස

**අතිරේකය**

**(2010.05.10 දින නිකුත් කරන ලදී)**

## මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන)

**ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම්වල හෝ ජන කැළඹීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන්ගේ ද, ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත ස්වාභාවිකව ව්‍යසනයක් හෝ විපත්තියක් මරණයට හේතුව වශයෙන් ඍජුව ම ආරෝපණය කළ හැකි තැනැත්තන්ගේ ද, මරණ ලියාපදිංචි කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 11.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන)

එල්.ඩී.—ඕ. 36/2008

**ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම්වල හෝ ජන කැළඹීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන්ගේ ද, ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත ස්වාභාවිකව ව්‍යසනයක් හෝ විපත්තියක් මරණයට හේතුව වශයෙන් ඍජුව ම ආරෝපණය කළ හැකි තැනැත්තන්ගේ ද මරණ ලියාපදිංචි කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

පූර්විකාව.

ශ්‍රී ලංකාවේ ඇති වූ ත්‍රස්තවාදී සහ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් හෝ ජන කැළඹීම් හේතුකොටගෙන උද්ගත වූ සිවිල් කෝලාහලවල දී නොයෙක් තැනැත්තන් මියගොස් ඇති හෙයින් ද :

ජාතික ප්‍රමාණයේ ස්වාභාවික ව්‍යසනවලට හෝ විපත්තිවලට මුහුණ පෑමෙන් නොයෙක් තැනැත්තන් මියගොස් සහ මරණයට පත් තැනැත්තන්ගේ සංඛ්‍යාව, බිය ජනක මට්ටමකට පත් වී ඇති හෙයින් ද :

ඉහත ගණනය කරනු ලැබූ අවස්ථා දෙකෙහි දී ම සිදු වූ එවැනි මරණ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කිරීමට බාධාවන්වන ඇතැම් ප්‍රායෝගික දුෂ්කරතා පවත්නා හෙයින් ද :

එවැනි මරණ ලියාපදිංචි කිරීමට හැකි වන සේ තාවකාලික විධිවිධාන සැලැස්වීමට දැන් අවශ්‍ය වී ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය, පනත ක්‍රියාත්මකව පවත්නා කාලය සහ එම කාලය දීර්ඝ කිරීම.

1. (1) මේ පනත 2010 අංක   දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ පනතේ විධිවිධාන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වර්ෂ තුනක කාලයක් ක්‍රියාත්මකව පවතින්නේ ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, මේ පනත ක්‍රියාත්මකව පැවතීමට නියමිත යම් කාලසීමාවක් ඉකුත් වීමට එක් මාසයකට පූර්වයෙන්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, පනත ක්‍රියාත්මකව පැවතීමට නියමිත කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය :

PL 004818 - 425 (2010/05)

එසේ වුව ද, එම යම් දීර්ඝ කිරීමක්, කිසිදු එක් අවස්ථාවක දී අවුරුදු දෙකක කාලසීමාවකට වඩා වැඩි නොවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රදානය කරන ලද යම් දීර්ඝ කිරීමක දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## I වන කොටස

### ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් හෝ ජන කැළඹීම් හේතුවෙන් අතුරුදහන් වී ඇති තැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම

*ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ආදිය හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් මරණ සහතික ඉල්ලුම් කළ හැක්කේ කවුරුන් විසින් ද යන වග සහ ඊට අදාළ කාර්ය පටිපාටිය.*

**2.** (1) යම් තැනැත්තකු අතුරුදහන් වී ඇති බවට වාර්තා වන සහ ඔහු ජීවත්ව සිටියේ නම් ඔහු ගැන ස්වාභාවික අසන්නට ලැබෙන්නේ යම් තැනැත්තන්ට ද ඒ තැනැත්තන්ට එක් අවුරුද්දක් ඉක්මවන කාලයක් තුළ දී ඔහු ගැන අසන්නට ලැබී නොමැති සහ ඔහුගේ අතුරුදහන් වීම ශ්‍රී ලංකාවේ සිදු වෙමින් පැවති ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකමකට හෝ ජන කැළඹීමකට ආරෝපණය කරනු ලැබිය හැකි අවස්ථාවක, ඔහු මියගොස් ඇතැයි ඔහුගේ ළඟම ඥාතියකු තරයේ ම විශ්වාස කරන්නේ නම්, ඒ තැනැත්තාගේ මරණය, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කිරීම පිණිස සහ ඔහු සම්බන්ධයෙන් මරණ සහතිකයක් තමා වෙත නිකුත් කරවා ගැනීම පිණිස, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ඒ ළඟම ඥාතියා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ ඒ සෑම ඉල්ලීමක් ම මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘතියට සාරානුකූල විය යුතු අතර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත හෝ ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි හෝ ඔහුගේ ස්ථිර වාසස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ උප්පැන්න හා මරණ පිළිබඳ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඉදිරිපත් කළ යුතු ය.

*අතිරේක කරුණු සැපයිය යුතු බව.*

**3.** මේ පනත යටතේ වූ සෑම ඉල්ලීමක් ම, මරණය ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන්නේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා මියගොස් ඇති බව තමාට විශ්වාස කිරීමට ඇති හේතු සඳහන් කරනු ලබන ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශයක් මගින් එකී ඉල්ලුම්කරු විසින් තහවුරු කරනු ලැබිය යුතු අතර, මරණය ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා

අවුරුදු එකකට වැඩි කාලයක් තුළ ජීවතුන් අතර සිටිනු තමා දැක නැති බව හෝ ඔහු ගැන අසා නැති බව ස්ථිර කරමින් ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි හෝ ඔහුගේ ස්ථිර වාසස්ථානය පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත් වාර්තාවක් සහ ඒ ඉල්ලීම තහවුරු කරන වෙනත් යම් සාක්ෂි ද සමග ඒ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ඉල්ලුම් පත්‍රය ප්‍රදර්ශනය කර තැබීම.

**4.** මේ පනත යටතේ ඉල්ලීමක් ලැබුණු විට, අවස්ථාවෝචිත පරිදි, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලීමේ පිටපතක් තමාගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ද, මරණය ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි හෝ ඔහුගේ ස්ථිර වාසස්ථානය පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිගේ කාර්යාලයේ ද සති දෙකක කාලයක් ප්‍රදර්ශනය කර තැබීමට සැලැස්විය යුතු ය.

ලියාපදිංචි කිරීමට විරෝධය දැක්වීම.

**5.** මේ පනත යටතේ වූ ඉල්ලීමක පිටපතක් 4 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළමු වරට ප්‍රදර්ශනය කරන ලද දිනයේ සිට එක් මාසයක් ඇතුළත දී ඒ ඉල්ලීම අදාළ වන තැනැත්තාගේ මරණය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට ඇති විරෝධතා ඒ තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එසේ විරෝධය පෑමට හේතු පැහැදිලිව දක්වමින් ඒ විරෝධය පාන්නා විසින් සහ වෙනත් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් මගින් ඒ විරෝධතා තහවුරු කරනු ලැබිය යුතු ය.

මරණය ලියාපදිංචි කිරීම.

**6.** (1) ඉල්ලීමකට විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දී ඇති එක් මාසයක කාලසීමාව ඉකුත් වූ පසු, ඒ ඉල්ලීම තහවුරු කිරීම පිණිස ඇති සාක්ෂි සහ යම් විරෝධතාවක් ඇත්නම් ඒ විරෝධතා ද, ඒ විරෝධතා තහවුරු කිරීමට ඇති සාක්ෂි ද සමග, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉල්ලීම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකා බැලිය යුතු අතර, ඔහු විසින් අවශ්‍ය යයි සලකන යම් පරීක්ෂණයකින් පසු ඉල්ලීමේ සඳහන් කරුණුවල සත්‍යතාව පිළිබඳ තමා සෑහීමකට පත් වන්නේ නම්, ඒ ඉල්ලීමට ඉඩ දිය යුතු ය. තව ද ඉහත කී පරිදි වූ ඒ පරීක්ෂණය අවසන් කිරීමෙන් පසුව ඔහුට නිසැකව ම දැන ගැනීමට හැකි වූ පරිදි, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය වන්නා වූ ඒ මරණය පිළිබඳ විස්තර සඳහන් කරමින් තමාගේ අත්සන යටතේ වූ වාර්තාවක් ඒ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාව ලැබීමෙන් පසු 7 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කරමින් යම් වාර්තාවක් ඔහු විසින් අවලංගු කරනු ලබන අවස්ථාවක දී හැර, ඒ වාර්තාවේ නිශ්චිතව සඳහන් කර ඇති විස්තර රෙජිස්ට්‍රාර්වරයකු විසින් උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පවත්වාගෙන යන මරණ ලේඛනයෙහි ඇතුළත් කර ඒ තැනැත්තා සඳහා මරණ සහතිකයක් නිකුත් කරන ලෙස, නිසි රෙජිස්ට්‍රාර්වරයකුට විධාන කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නියමයක් කළ යුතු ය.

(3) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ තමා විසින් පවත්වාගෙන යනු ලබන මරණ ලේඛනයෙහි අදාළ මරණය සම්බන්ධයෙන් වූ විස්තර ඇතුළත්කර ඒ තැනැත්තා සඳහා මරණ සහතිකයක් නිකුත් කරන ලෙස විධාන කරමින් (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක් රෙජිස්ට්‍රාර්වරයකුට ලැබුණ විට, ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ විස්තර ඒ ලේඛනයෙහි වහාම ඇතුළත් කොට ලේඛනයෙහි නියම ස්ථානයෙහි තම අත්සන යොදා මරණ සහතිකය නිකුත් කළ යුතු ය.

(4) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ ලිඛිත නියමය අදාළ ලියාපදිංචි කිරීමේ සටහනේ අනු පිටපතට ඇමිණිය යුතු අතර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ භාරයේ ඔහුගේ කාර්යාලයේ තබා ගැනීම සඳහා ඔහු වෙත යැවීම පිණිස, එකී නියමය අමුණන ලද අනු පිටපත රෙජිස්ට්‍රාර්වරයා විසින් නිසි දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

**සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම ආදියට විරුද්ධව අභියාචනය.**

7. මේ පනතේ 6 වන වගන්තිය යටතේ, තමාට මරණ සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් ඉල්ලුම්කරුවකු විසින් හෝ මරණ සහතිකයක් නිකුත් කිරීමට විරුද්ධව මේ පනතේ 5 වන වගන්තිය යටතේ තම විරෝධතා ඉදිරිපත් කර තිබිය දී එකී සහතිකය නිකුත් කිරීමට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා ගත් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි එකී ප්‍රතික්ෂේප කිරීම හෝ සහතිකය නිකුත් කිරීමට විරුද්ධව අභියාචනයක්, අවස්ථාවෝචිත පරිදි, එම ප්‍රතික්ෂේප කිරීම හෝ සහතිකය නිකුත් කිරීම පිළිබඳව වූ දැන්වීමේ දින සිට මාසයක් ඇතුළත දී රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඉදිරිපත් කර ඇති කරුණු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සමාලෝචනය කිරීමෙන් පසු, අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය

ස්ථිර කිරීම හෝ 6 වන වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන ලෙස ඒ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට විධාන කිරීම හෝ 6 වන වගන්තිය යටතේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද වාර්තාව ප්‍රතික්ෂේප කිරීම හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

**පරීක්ෂණ කොමිෂන් සභාවක් හෝ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් තීරණය කරගත් තොරතුරු අදාළ වන තැනැත්තන්ගේ මරණය ලියාපදිංචි කිරීමට අදාළ විශේෂ ක්‍රියා පරිපාටිය.**

8. (1) (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලබන කොමිෂන් සභාවක් විසින් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින්, යම් තැනැත්තකු අතුරුදහන් වී ඇති බවට නැතහොත් සොයාගත නොහැකි බවට තොරතුරු අනාවරණය කරගනු ලැබූ අවස්ථාවක දී, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඒ තැනැත්තාගේ මරණය ලියාපදිංචි කරන ලෙස සහ ඒ තැනැත්තාගේ මරණ සහතිකය තමා වෙත නිකුත් කරන ලෙස ඉල්ලීමක්, මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව, ඒ තැනැත්තාගේ ළඟම ඥාතියා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත හෝ ඒ තැනැත්තා අන්තිමට පදිංචිව සිටි හෝ ඔහුගේ ස්ථිර වාසස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ උප්පැන්න සහ මරණ පිළිබඳ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය. එවැනි සෑම ඉල්ලීමක් සමග ම, එකී ඉල්ලුම්කරු විසින් 3 වන වගන්තිය ප්‍රකාර දෙනු ලබන දිවුරුම් ප්‍රකාශයක් සහ අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාට අදාළව පරීක්ෂණ කොමිෂන් සභාව හෝ විශේෂ ජනාධිපති කොමිෂන් සභාව අනාවරණය කරගත් කරුණුවල සහතික කළ පිටපතක් ද අමුණා තිබිය යුතු ය.

(2) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත (1) වන උපවගන්තය යටතේ වූ ඉල්ලීමක් ලැබුණු විට, මේ පනතේ පෙරාතුව වූ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඉල්ලුම් පත්‍රයෙන් සහ ඊට අමුණා තිබුණු දිවුරුම් ප්‍රකාශයෙන් හා අනාවරණය කරගත් කරුණුවලින් තහවුරු කර ගැනීමට තමාට හැකි වූ ද, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඒ මරණ ලියාපදිංචි කිරීමට අවශ්‍ය වන්නා වූ ද, විස්තර සඳහන් කරමින් තම අත්සන යටතේ වූ වාර්තාවක්, එකී දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් වහාම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත (2) වන උපවගන්තිය යටතේ වූ වාර්තාවක් ලැබුණු විට, එකී වාර්තාවේ නිශ්චිතව සඳහන් විස්තර, නිසි රෙජිස්ට්‍රාර්වරයා විසින් උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පවත්වාගෙන යනු ලබන මරණ ලියාපදිංචි කිරීමේ ලේඛනයේ ලියාපදිංචි කර ඒ තැනැත්තා සම්බන්ධයෙන් මරණ සහතිකයක් නිකුත් කරන ලෙස ඒ රෙජිස්ට්‍රාර්වරයාට විධාන කෙරෙන නියමයක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කළ යුතු ය.

(4) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පවත්වාගෙන යනු ලබන ලේඛනයේ එකී මරණයට අදාළ විස්තර ඇතුළත් කරන ලෙස විධාන කරමින් (3) වන උපවගන්තිය යටතේ නියමයක් රෙජිස්ට්‍රාර්වරයාට ලැබුණු විට, ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් වහාම එම විස්තර එම ලේඛනයේ ඇතුළත් කොට නිසි ස්ථානයේ අත්සන් කළ යුතු ය.

(5) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් (3) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ ලිඛිත නියමය අදාළ ලියාපදිංචි කිරීමේ සටහනේ අනු පිටපතට ඇමිණිය යුතු අතර, එය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ භාරයේ ඔහුගේ කාර්යාලයේ තබා ගැනීම සඳහා ඔහු වෙත යැවීම පිණිස, එකී නියමය අමුණන ලද අනු පිටපත රෙජිස්ට්‍රාර්වරයා විසින් නිසි දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත කර ඇති අවස්ථාවක, (2) වන හා (5) වන උපවගන්තිවල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා සම්බන්ධයෙන් කර ඇති සඳහන් කිරීමක් පිළිබඳ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සම්බන්ධයෙන් කර ඇති සඳහනක් ලෙස අදාළ විය යුතු ය.

## II වන කොටස

### ස්වභාවික ව්‍යසන හෝ විපත්ති හේතුවෙන් අතුරුදහන් වී ඇති තැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම

ජාතික ව්‍යසන ප්‍රදේශ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රකාශයට පත් කළ හැකි බව.

**9.** මුළු ශ්‍රී ලංකාවට ම හෝ ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශවලට හෝ ජීවිත හානි හෝ දේපළ හානි සිදු කර ජාතික මට්ටමෙන් බැරෑරුම් විපාක ඇති කළ ස්වභාවික ව්‍යසනයක් හෝ විපත්තියක් ශ්‍රී ලංකාව තුළ සිදු වී ඇත්තා වූ ද, ඒ ව්‍යසනයේ හෝ විපත්තියේ ප්‍රතිඵලයක් ලෙස මරණයට පත් වූ තැනැත්තන් සංඛ්‍යාව බිය ජනක මට්ටමකට පත්ව ඇති හා ඒ හේතුවෙන් ඒ තැනැත්තන්ගේ මරණ

ලියාපදිංචි කිරීමේ දී උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අදාළකර ගැනීම ප්‍රායෝගික නොවන්නා වූ ද අවස්ථාවක දී, එම ස්වභාවික ව්‍යසනය හෝ විපත්තිය සිදු වී තිබෙන බව තහවුරු කර ගැනීමෙන් පසු, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒ ව්‍යසනයට හෝ විපත්තියට ගොදුරු වූ කවර හෝ පරිපාලන දිස්ත්‍රික්කයක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාසයක්, “ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශයක්” බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

*යම් ස්වභාවික ව්‍යසනයක හෝ විපත්තියක හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් මරණ සහතික ඉල්ලුම් කළ හැක්කේ කා විසින් ද යන වග සහ ඊට අදාළ කාර්ය පටිපාටිය.*

**10.** (1) (අ) 9 වන වගන්තිය යටතේ ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කළ ප්‍රදේශයක් තුළ වාසය කළ ; හෝ

(ආ) වෙනත් යම් ප්‍රදේශයක වාසය කරමින් සිටි එහෙත් ඒ ව්‍යසනය හෝ විපත්තිය සිදු වූ අවස්ථාවේ දී, 9 වන වගන්තිය යටතේ ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ යම් ප්‍රදේශයකට ගොස් සිටි බව හෝ ඒ ප්‍රදේශයක් ඇතුළත සිටි බව දන්නා,

තැනැත්තකු හෝ තැනැත්තන්, ඒ ව්‍යසනයෙන් හෝ විපත්තියෙන් පසුව සොයාගත නොහැකිව තිබෙන සහ ඒ ව්‍යසනයේ හෝ විපත්තියේ ප්‍රතිඵලයක් වශයෙන් සත්‍ය වශයෙන් අතුරුදහන් වී තිබෙන අවස්ථාවක, ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ ළඟම ඥාතියකු හෝ පවුලේ කිසිම සාමාජිකයකු එම ව්‍යසනයෙන් දිවි ගලවාගෙන නොමැති විටක ඒ තැනැත්තා හෝ තැනැත්තන් පිළිබඳව දැනීමක් ඇති යම් තැනැත්තකු විසින්, පළමු කී තැනැත්තා හෝ තැනැත්තන් මියගොස් ඇති බව තරයේ විශ්වාස කරනු ලබන්නේ නම්, ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ මරණ, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරවා ගැනීම පිණිස සහ ඒ තැනැත්තා හෝ තැනැත්තන්ගේ මරණ සම්බන්ධයෙන් මරණ සහතිකයක් හෝ මරණ සහතික තමා වෙත නිකුත් කරවා ගැනීම පිණිස, ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) ඒ සෑම ඉල්ලීමක් ම, මරණය ලියාපදිංචි කිරීමට ඉල්ලා සිටින්නේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා පුරුද්දක් වශයෙන් වාසය කළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) ඒ සෑම ඉල්ලුම් පත්‍රයක් ම, කවර වූ හෝ ආකෘතියකින් සහ හැකි සෑම අවස්ථාවක දී ම, මෙහි උපලේඛනයේ දැක්වෙන තොරතුරු අතරින් යටත් පිරිසෙයින් සමහරක් හෝ අන්තර්ගතව ඉදිරිපත් කළ යුතු අතර, ඒ තොරතුරු ප්‍රායෝගිකව හැකිතාක් ප්‍රමාණයට, මරණය ලියාපදිංචි කිරීමට අපේක්ෂිත තැනැත්තාගේ විස්තරයක් විය යුතු ය. එම කරුණු සනාථ කරන දිවුරුම් ප්‍රකාශයක් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක් සමග ම ඉදිරිපත් කළ යුතු ය. ඒ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු කල්හි ග්‍රාම නිලධාරී ඔහුට අවශ්‍ය යයි හැඟී යන පරීක්ෂණයකින් පසුව එම ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර හැකිතාක් ඉක්මණින් එය එහි ප්‍රකාශිත කරුණු පිළිබඳව ඔහුගේ උපරිම දැනීමේ ප්‍රමාණයට නිරවද්‍යතාවය සහතික කරන වාර්තාවක් ද සමග, ඒ ඉල්ලුම්පත්‍රය ඔහුගේ ග්‍රාම නිලධාරී කොට්ඨාසය පිහිටා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රාදේශීය ලේකම්වරයා ඒ සෑම ඉල්ලුම් පත්‍රයක් ම පිටසන් කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව යථා පරිදි නිර්දේශ කරන ලද සහ පිටසන් කරන ලද (2) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, රෙජිස්ට්‍රාස් ජනරාල්වරයා විසින් නිසි රෙජිස්ට්‍රාර්වරයා වෙත ඔහු විසින් උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පවත්වාගෙන යන මරණ ලේඛනයෙහි, ඒ ඉල්ලුම් පත්‍රයේ නිශ්චිතව සඳහන් විස්තර ලියාපදිංචි කරන ලෙස සහ ඉල්ලුම් පත්‍රය අදාළ වන ඒ තැනැත්තා වෙනුවෙන් මරණ සහතිකයක් නිකුත් කරන ලෙස විධාන කරන නියමයක් කරනු ලැබිය යුතු ය.

(5) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ තමා විසින් පවත්වාගෙන යනු ලබන මරණ ලේඛනයෙහි අදාළ මරණය සම්බන්ධයෙන් වූ විස්තර ඇතුළත් කරන ලෙස විධාන කරන (4) වන උපවගන්තිය යටතේ වූ නියමයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබුණු විට ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් එම විස්තර එම ලේඛනයෙහි වහාම ඇතුළත් කර ලේඛනයේ නිසි ස්ථානයෙහි තම අත්සන යෙදිය යුතු ය.

(6) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් (4) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ ලිඛිත නියමය, අදාළ ලියාපදිංචි කිරීමේ සටහනේ අනුපිටපතට ඇමිණිය යුතු අතර, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ භාරයේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ කාර්යාලයේ තබා ගැනීම සඳහා ඔහු වෙත යැවීම පිණිස, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ අනුපිටපත සමඟ නියමය නිසි දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත කෙලින් ම යවනු ලැබූ අවස්ථාවක, (2) වන උපවගන්තියේ සිට (6) වන උපවගන්තිය දක්වා වූ උපවගන්තිවල විධිවිධානවල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා පිළිබඳව ඇති සඳහන් කිරීම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා පිළිබඳ සඳහන් කිරීම් සේ, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

විදේශිකයන්ගේ මරණ ලියාපදිංචි කිරීම.

**11.** වෙනත් රජයක ජාතිකයකු ශ්‍රී ලංකාවට පැමිණ සිටි බවට ද, 9 වන වගන්තිය යටතේ ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත ප්‍රදේශයක තාවකාලිකව පදිංචිව සිටි බවට ද, ප්‍රස්තුත ස්වභාවික ව්‍යසනයේ හෝ විපත්තියේ ප්‍රතිඵලයක් ලෙස ඒ තැනැත්තා මරණයට පත් වී තිබෙන බව පෙනී යන බවට ද පෙන්නුම් කෙරෙන සාක්ෂි ඇති අවස්ථාවක, ඒ තැනැත්තා සඳහා මරණ සහතිකයක් තමා වෙත නිකුත් කරවා ගැනීම පිණිස, එකී කරුණු පිළිබඳව දැනීමක් ඇති යම් තැනැත්තකු විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. ඒ සෑම ඉල්ලුම් පත්‍රයක් ම මරණයට පත් තැනැත්තා පුරවැසියකුව සිටි රට වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින නියෝජිතයා විසින් සහතික කර ඒ ඉල්ලුම් පත්‍රය කෙලින් ම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් වහාම ඒ මරණය ලියාපදිංචි කර ඒ තැනැත්තා වෙනුවෙන් මරණ සහතිකයක් නිකුත් කිරීමට ක්‍රියා කළ යුතු ය.

## **III** වන කොටස

## විවිධ විධිවිධාන

සාක්ෂි ආඥාපනතේ විධිවිධාන අදාළ නොවන බව.

**12.** 1988 අංක 10 දරන, සාක්ෂි (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි වූ සාක්ෂි ආඥාපනතේ 108 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, මේ පනතේ මේ කොටසේ විධිවිධාන, ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් හෝ ජන කැළඹීම් නැතහොත් 9 වන වගන්තියට අනුකූලව ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ ප්‍රදේශයක් ඇතුළත සිදු වී ඇති යම් ස්වභාවික ව්‍යසනයක් හෝ විපත්තියක් නිසා සිදු වන ලදැයි සැලකිය හැකි කවර හෝ තැනැත්තකුගේ මරණයක් සඳහා මරණ සහතිකයක් නිකුත් කිරීමකට අදාළ විය යුතු ය.

වියගිය බවට ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු ජීවත් සිටින බව දැනගන්නට ලැබුණහොත් අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය.

**13.** (1) මේ පනතේ 2 වන හෝ 10 වන වගන්ති යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාරව යම් මරණයක් ලියාපදිංචි කර තිබිය දී, මරණය ලියාපදිංචි කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා ජීවත්ව සිටින බව ඉන් පසුව කිසියම් වේලාවක යම් තැනැත්තකුට දැනගන්නට ලැබුණහොත්. ඔහු විසින් වහාම ඒ බව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.

(2) ඒ තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ලැබුණු විට ඔහු විසින් අදාළ පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධරයා වෙත ඒ තොරතුරු දන්වා යැවිය යුතු අතර, ඒ නිලධරයා විසින් ඒ තොරතුරේ සත්‍යතාව විමර්ශනය කොට, තමා වෙත ඒ තොරතුරු දැනුම් දුන් දිනයේ සිට සති හතරක් ඇතුළත දී රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වාර්තාවක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ලැබුණු විට, අවශ්‍ය යයි ඔහු සලකන යම් පරීක්ෂණයකින් පසුව, මරණය ලියාපදිංචි කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා ජීවත්ව සිටින බවට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සෑහීමට පත් වුවහොත්, ඔහු විසින්, තත් කාරණයේ අවස්ථාගත කරුණු අනුව යෝග්‍ය වන පරිදි, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 52 වන වගන්තිය යටතේ යම් පියවරක් ගැනීම හෝ යම් නියමයක් කිරීම හෝ යම් විධානයක් කිරීම කළ යුතු ය.

(4) මේ පනත යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන යම් පරීක්ෂණයක් ආරම්භ කිරීමෙන් පසු එක් මාසයක් ඇතුළත දී අවසන් කරනු ලැබිය යුතු අතර, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පවත්වනු ලබන පරීක්ෂණයකට අදාළව ඒ පනත යටතේ පරීක්ෂණයක කාර්යය සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි සියලු බලතල මේ පනත යටතේ පරීක්ෂණයක කාර්යය සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

සැක දුරු කිරීම.

**14.** (අ) 1 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාල සීමාව ඉකුත් වීම මත, මේ පනත ක්‍රියාත්මක වීම අවසන් වී ඇත්නම් සහ මේ පනත ක්‍රියාත්මක වන කාල සීමාව දීර්ඝ කිරීම සඳහා 1 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියමයක් කර නොමැති නම් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මකව පවතින කාල සීමාව ඉකුත් වීමට පෙරාතුව, 2 වන සහ 10 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව තැනැත්තකු මරණයට පත් වී ඇති බවට වාර්තා කරනු ලැබ, ඒ තැනැත්තාට අදාළව මරණ සහතිකයක් නිකුත් කරවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර තිබේ නම්,

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් මේ පනතේ I වන කොටසේ සහ II වන කොටසේ විධිවිධාන ප්‍රකාර ඒ තැනැත්තාගේ මරණය ලියාපදිංචි කිරීම පිළිබඳ කටයුතු සිදු කර, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මරණ සහතිකයක් නිකුත් කළ යුතු බව, සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

**15.** (අ) මේ පනත යටතේ තමා විසින් කරන ලද ඉල්ලීමක දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් කරන්නා වූ හෝ මේ පනත යටතේ අසත්‍ය තොරතුරක් සපයන්නා වූ ; හෝ වැරදි.

(ආ) මේ පනත යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාර මරණය ලියාපදිංචි කරනු ලැබ තිබෙන යම් තැනැත්තකු ජීවත්ව සිටින බව දැනගෙන, ඒ තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත සැපයීම පැහැර හරින්නා වූ ; හෝ

(ඇ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද මරණ සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් වන තැනැත්තා ජීවත්ව සිටින බව දැන දැන හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු තිබිය දී වංක සිතින් හෝ ප්‍රෝඩාකාරී ලෙස භාවිත කරන්නා වූ,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

**16.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"නිසි දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා," "නිසි රෙජිස්ට්‍රාර්වරයා" සහ "දිස්ත්‍රික්කය" යන යෙදුම්වල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතෙහි ඒවාට පිළිවෙලින් දී ඇති අර්ථය ම ඇත්තේ ය.;

"උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත" යන්නෙන් (110 වන අධිකාරය වූ) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත අදහස් වේ;

"දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කර ඇති උප්පැන්න සහ මරණ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙක් අදහස් වේ;

"රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන්, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කරන ලද උප්පැන්න සහ මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අදහස් වන අතර, ඊට අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු හෝ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු ද ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**උපලේඛනය** [2 වන හා 10 වන වගන්ති]

අතුරුදහන් වූ තැනැත්තකුගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා
ඉල්ලුම් පත්‍රය.

1. අතුරුදහන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම:..........................
2. ස්ත්‍රී පුරුෂ භාවය සහ ජාතිය:..........................................
3. වයස:...................................................................
4. මරණය සිදු වූ දිනය (ආසන්න වශයෙන්):...... ..........................
5. අන්තිමට පදිංචිව සිටියේ යයි දන්නා ස්ථානයේ ලිපිනය:......................................................................
6. ස්ථිර පදිංචිය දැරූ ස්ථානය:..........................................
7. පදවිය හෝ වෘත්තිය:....................................................
8. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම සහ පදිංචි ස්ථානය:.......................
9. අතුරුදහන් වූ තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධතාව:.........

යට කී..................................................(මියගිය තැනැත්තාගේ නම) අවුරුද්දකට වැඩි කාලයක් අතුරුදහන්ව සිටින බවත්, එකී....................................................මිය ගොස් ඇති බව මා තරයේ විශ්වාස කරන බවත්..............................................පදිංචි ............................................නැමති මම මෙයින් ප්‍රකාශ කරමි.

එම නිසා (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඔහුගේ/ඇයගේ මරණය ලියාපදිංචි කරන ලෙස සහ එම මරණය සම්බන්ධයෙන් මරණ සහතිකයක් මා වෙත නිකුත් කරන ලෙසත් මම ඉල්ලා සිටිමි.

..........................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය:..........................

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.